Department of Education Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ගිණුම්කරණය

සතිය - 4

ශ්‍රේණිය - 13

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය ,රත්නපුර

නිපුණතාව 11.0 - මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිත කරයි.

නිපුණතා මට්ටම 11.4 - තොග සම්බන්ධ මූලික සංකල්ප විග්‍රහ කර තොග ගිණුම්ගත කරයි.

**තොග යනු -**

- සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකිණීමට තබා ගෙන ඇති (නිමි තොග)
- එවැනි විකිණීමක් සඳහා නිෂ්පාදනය වෙමින් පවතින (නොනිමි තොග)
- නිෂ්පාදන ක්‍රියාවලිය තුළ හෝ සේවා සැපයීමේදී පරිභෝජනය සඳහා තබා ගන්නා ද්‍රව්‍ය (අමුද්‍රව්‍ය තොග) වේ.

**තොග පිරිවැය මූලිකාංග -**

- මිලදී ගැනුම් පිරිවැය
- පරිවර්තන පිරිවැය
- තොග වත්මන් ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් පිරිවැය

**ඇගයීම**

1.ශුද්ධ උපලබ්ධි අගය යනු කුමක්ද?

2.ශුද්ධ උපලබ්ධි අගය තීරණය කිරීමේ ක්‍රම මොනවාද?

3.තොග ප්‍රමිතයෙන් නිර්දේශ කර ඇති පිරිවැය සූත්‍ර දෙක නම් කර පැහැදිලි කරන්න.

4.තොග වියදමක් ලෙස හඳුනා ගන්නා අවස්ථා දෙක මොනවාද?